# මධ්‍යම පළාත් ළමා නාට්‍ය උළෙල 2021

සමාජ ප්‍රස්තුතයක් තුලින් සජීවීව ජන මනස ආමන්ත්‍රණය ට ලක් කල හැකි ප්‍රකාශන මාධ්‍යයක් ලෙස වේදිකා නාට්‍ය කලාව දැක්වීමට පුලුවන. චිත්තරූප ආවේගයන් දෙබස් තුලින් හා ආංගික අභිනයන් මඟින් ප්‍රබල ලෙස ප්‍රකාශ කරමින් ශ්‍රාවක ප්‍රේක්ෂක පිරිසක් වෙත එම සමාජ ප්‍රස්තුතය පිළිබඳව නව අර්ථකතනයක් ලබාදීම වේදිකා නාට්‍යයක අරමුණ ලෙස හැඳින්වීමට පුලුවන.

වේදිකා නාට්‍ය කලාව ප්‍රසාරණය වීම හේතුවෙන් නාට්‍ය නිෂ්පාදනයවන ක්ෂේත්‍රයද ප්‍රසාරණය විය. එහි ප්‍රතිඵලය වූයේ ළමා ලෝකය පදනම් කරගත් නාට්‍ය කලාවක් බිහිවීමයි. දශක දෙක තුනකට පෙර අපේ දරුවන් භුක්තිවිඳි සුන්දර ළමා අවධිය මේ වන විට ඔවුන්ගෙන් ගිලිහී ගොස් තරඟකාරී අධ්‍යාපන ක්‍රමයත්, නූතන තාක්ෂණික මෙවලමුත් , සමඟ අතිශය සීමාකාරී වූ නිවාස වටපිටාවක ජීවත්වීම හේතුවෙන් නිර්මාණශීලී ක්‍රියාශීලී දරුවන් වෙනුවට ස්වාර්ථය පදනම් කරගත් දරු පරපුරක් බිහිවී ඇත. එයින් ප්‍රබුද්ධ පරිකල්පන ශක්තියෙන් හෙබි විචාරශීලී නිර්මාණාත්මක දරු පරපුරක් අපට අහිමිවිය.

මෙම හිස් අවකාශය තුරන් කිරීමට බිහිවූ ළමා නාට්‍ය කලාවට ඇල්මක් දක්වන මධ්‍යම පළාතේ නාට්‍ය නිෂ්පාදනය කරන අධ්‍යක්ෂණය කරන හා රංග වේදිකාවට ඇල්මක් දක්වන ශිල්පීන් ශිල්පිනියන්හට අත්වැලක් වීම අරමුණු කොට ගෙන ළමා නාට්‍ය තරඟාවලියක් වාර්ෂිකව ක්‍රියාත්මක කිරීම මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අභිප්‍රාය ලෙස දක්වමි.

ඒ මඟින් අගති ගාමී සමාජ ප්‍රවණතාවයක් මැද සුගතිගාමී දරු පරපුරක් දැයට බිහිකර සමාජ හර පද්ධතීන් සුරකින සමාජ ක්‍රමයක් බිහිකිරීම ප්‍රධාන අරමුණ ලෙස දක්වමි.

එසේම

- # ළමා ලෝකය පිළිබඳව අවබෝධය ඉහළ නැංවීම
- # පෞරුෂත්වයෙන් හෙබි ළමා පරපුරක් දැයට දායාද කිරීම
- # සමාජ අපචාරයන් පිළිබඳව දරුවන් දැනුවත් කිරීම
- # විචාරශීලී අවබෝධය සහිත දරුවන් පිරිසක් බිහිකිරීම
- # දරුවන් පිළිබඳ සමාජ සජීවීකරණය කිරීම

ඒ සඳහා - මධ්‍යම පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සේවයේ නිරත සංස්කෘතික නිළධාරින් මඟින් පළාත තුළ ප්‍රචාරණ කටයුතු කිරීමෙන් අයදුම්පත් කැඳවා

- # නාට්‍ය අධ්‍යක්ෂවරුන් සඳහා ප්‍රවීන සම්පත්දායකයින් මඟින් ප්‍රායෝගික පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම
- # නාට්‍ය අත්පිටපත් රැස්කිරීම
- # අත්පිටපත් විනිශ්චය කිරීම කර සාර්ථක අත්පිටපත් නිෂ්පාදනය කිරීමට අවස්ථාව ලබාදීම
- # නිෂ්පාදනය කරන ලද නාට්‍ය තරඟාවලියට යොමු කිරීම මඟින් ජයග්‍රාහී නට්‍ය තෝරා ගැනීම
- # ජයග්‍රාහී නිර්මාණ හා ශිල්පීන් ඇඟයීමට ලක්කිරීම.

මඟින් ජයග්‍රාහී ළමා නාට්‍ය , හා සෙසු ජයග්‍රාහක,ජයග්‍රාහිකාවන් තෝරා ගැනීමට කටයුතු කරනු ඇත.

ඒ මඟින් - ළමා නාට්‍ය තරඟාවලියේ ( කුසලානය,සහතික පත් හා මුදලින් ත්‍යාගය )

| | | |
|---|---|---|
| # | ජයග්‍රාහී ප්‍රථම ස්ථානය | රු . 17,500.00 |
| # | ජයග්‍රාහී දෙවන ස්ථානය | රු. 15,000.00 |
| # | ජයග්‍රාහී තෙවන ස්ථානය | රු. 12,000.00 |

කුසලතා ජයග්‍රහණ සඳහා ( සහතික පත් හා මුදලින් ත්‍යාගය )

| | | |
|---|---|---|
| # | ජයග්‍රාහී සිව්වන ස්ථානය | රු. 10,000.00 |
| # | ජයග්‍රාහී පස්වන ස්ථානය | රු. 10,000.00 |

විශේෂ කුසලතාවන් සඳහා ( කුසලානය, සහතිකපත් හා මුදලින් ත්‍යාගය )

| | | |
|---|---|---|
| # | දක්ෂතම ළමා නළුවා | රු. 7500.00 |
| # | දක්ෂතම ළමා නිළිය | රු. 7500.00 |
| # | හොඳම සංගීත නිර්මාණය | රු. 7500.00 |
| # | හොඳම වේදිකා පසුතල නිර්මාණය | රු. 7500.00 |
| # | හොඳම අධ්‍යක්ෂණය | රු. 7500.00 |
| # | හොඳම රංග වස්ත්‍ර නිර්මාණය | රු. 7500.00 |
| # | හොඳම රචනය | රු. 7500.00 |

# ජයග්‍රහණ නොලබන කණ්ඩායම් සඳහා සහභාගීත්වය වෙනුවෙන්
( 5000 x 5 ) රු. 25,000.00

වශයෙන් මුදල් ත්‍යාග, සහතික පත් හා කුසලාන පිරිනැමීම සිදුකෙරේ.
තරඟ කොන්දේසි -

01. මධ්‍යම පළාතේ ස්ථිර පදිංචි නිර්මාණකරුවන් සඳහා පමණක් තරඟාවලිය විවෘතය.

02. අවම විනාඩි 15 හා උපරිම විනාඩි 25 කාලයක් සඳහා වයස අවු 18 ට අඩු දරුවන් පමණක් රංගනයට යොදාගෙන සහභාගිවන සියලු දෙනාම ඇතුලත්ව 15 කට සීමාකර ගනිමින් ළමා ලෝකයට උචිත තේමාවකින් යුතු නාට්‍යයක් විය යුතුය.

03. නාට්‍යය සඳහා සහභාගී කරගන්නා දරුවන් වෙනුවෙන් දෙමාපියන්ගෙන් / දහම් පාසල් ප්‍රධානාචාර්ය ස්වාමීන් වහන්සේගේ / පාසලේ විදුහල්පති තුමාගේ, තුමියගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය.

04. මෙම තරඟාවලිය විවෘත තරඟාවලියක් බැවින් රංගනය හැර සෙසු අවශ්‍යතාවන් අධ්‍යක්ෂකගේ අභිමතය පරිදි සකස්කර ගැනීමට අවසරය ඇත.

05. කුමන හෝ ආකාරයේ රාජ්‍ය නාට්‍ය උත්සවයකට ඉදිරිපත් කර ජයග්‍රහණය නොලැබූ , පාසල් විෂය නිර්දේශයට ඇතුලත් නොවන, ස්වතන්ත්‍ර,පරිවර්තන,අනුවර්තන හා වෙනත් ආකාර ආකෘතියක නාට්‍යයක් විය යුතුය.

06. නාට්‍යය තුළ කවර හෝ ආකාරයේ අසභ්‍ය රංගනයක්,දෙබස්,මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධ රංගන ඇතුලත් නොවිය යුතු අතර, කිසියම් ආගමක්,ජාතියක්,පුද්ගලයෙක්,දේශපාලන පක්ෂයක්,හෝ ආයතනයක් විවේචනය නොවිය යුතුය.

07. තරඟාවලියට අයදුම්කිරීමෙන් පසු ,අයදුම් පත්‍රයේ හැර නම් නොලියන ලද නාට්‍යයේ අත් පිටපත්,කථා සාරාංශය, දෘෂ්ඨිය හා චරිත විග්‍රහය ද සමඟ පිටපත් 04 කින් තනි පැත්තේ පරිගණක ගතකර හෝ පැහැදිලි අත් අකුරින් ලියා 2021.04.30 දිනට පෙර සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, යටිනුවර වීදිය,මහනුවර. යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් බාරදිය හැකිය. ලිපි කවරය වම්පස ඉහල කෙලවරේ මධ්‍යම පළාත් ළමා නාට්‍ය උළෙල 2021 සඳහන් කරන ලෙස දන්වමි.

08. නිෂ්පාදනය කරන ලද නාට්‍ය ප්‍රවීන විනිශ්චය මණ්ඩලයක් මඟින් විනිශ්චය කරනු ලබන අතර තරඟාවලියට ඉදිරිපත් කරන ළමා නාට්‍ය පිළිබඳ විරෝධතා විනිශ්චය අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතු අතර ඉන්පසු ඉදිරිපත් කරනු ලබන විරෝධතා නොසලකා හැරේ.

09. ජයග්‍රාහී නාට්‍ය තෝරා ගැනීමෙන් පසු ජයග්‍රාහක ජයග්‍රාහිකාවන් සඳහා ත්‍යාග සහතික පත් හා කුසලාන, කෙටි චිත්‍රපට උත්සවයේ දී ප්‍රදානය කරන අතර, එහිදී ජයග්‍රාහී නාට්‍යය ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව ලබාදෙන අතර එය උත්සවයේ කටයුතු වලට බාධාවක් නොවන ලෙස කළ යුතුය.

10. තරඟාවලියේ විනිශ්චය මණ්ඩල තීරණය පළාත් සංස්කෘතික අධ්‍යක්ෂකගේ අනුමැතියෙන් පසු අවසන් තීරණය බවට පත්වන අතර තරඟාවලිය පිළිබඳව / චක්‍රලේඛ සංශෝධන පිළිබඳව අවසන් තීරණය පළාත් සංස්කෘතික අධ්‍යක්ෂවරයා සතුවේ.

11. තරඟාවලියට අදාලව මෙම දෙපාර්තමේන්තුව මගින් ගනු ලබන තීන්දු තීරණ වලට එකඟව කටයුතු කල යුතු අතර තරඟාවලිය සඳහා නොතේරුන අත්පිටපත් එම තරඟකරුවන්ට නැවත ලබාගැනීමට අවස්ථාව ඇත.

ස්වර්ණා පෙරේරා,<br>
පළාත් අධ්‍යක්ෂ,<br>
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,<br>
මහනුවර.

මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
ළමා නාට්‍ය තරඟාවලිය 2021 අයදුම් පත්‍රය

01. අධ්‍යක්ෂකගේ නම - --------------------------------------------------------------------------------
02. ලිපිනය - --------------------------------------------------------------------------------
03. හැඳුනුම්පත් අංකය --------------------------------------------------------------------------------
04. ඊ මේල් ලිපිනය - --------------------------------------------------------------------------------
05. දුරකථන අංක ජංගම ------------------------------ නිවස ------------------------------
06. ළමා නාට්‍යයේ නම --------------------------------------------------------------------------------
07. රචකයාගේ නම --------------------------------------------------------------------------------
08. රචකයාගේ දුරකථන අංක ජංගම ------------------------------ නිවස ------------------------------
09. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය --------------------------------------------------------------------------------
10. පාසලේ,දහම් පාසලේ, ළමා සමාජයේ නම සහ ලිපිනය ------------------------------------------------
--------------------------------------------------------------------------------

මා විසින් මෙම ඉල්ලුම් පත්‍රයේ සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් මාගේ නාට්‍ය , නාට්‍ය උළෙලට තෝරාගනු ලැබුවහොත් පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රදර්ශනය කිරීමටත් එකඟ වෙමි. මා විසින් සපයා ඇති තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් හෝ ව්‍යවස්ථාවේ කරුණු උල්ලංඝනය කිරීමක් සිදුවී ඇති බව අනාවරණය වන කුමන අවස්ථාවකදී හෝ මධ්‍යම පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තු ළමා නාට්‍ය තරඟාවලියෙන් ඉවත් කිරීමටත් දෙපාර්තමේන්තුවට අයිතිය ඇති බව පිළිගනිමි.

දිනය - ------------------------------

අත්සන

--------------------------------------------------------------------------------

පාසල්,දහම් පාසල්, ළමා සමාජ අයදුම්කරුවන් සඳහා

මෙම නිර්මාණය ඉහත නම සඳහන් --------------------------------------------------------------------------------
මයා/මිය/මෙනවිය/ශිෂ්‍යයා/ශිෂ්‍යයාවගේ නිර්මාණයක් බවත් ඔහු /ඇය/ මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ -----------
--------------------------------------------------------------------------------

ළමා සමාජයේ සාමාජිකයෙකු / පාසලේ/ දහම් පාසලේ / ශිෂ්‍යයකු /ශිෂ්‍යාවක බවත් සහතික කරමි.

දිනය - ------------------------------

අත්සන

නිලමුද්‍රාව - ප්‍රාදේශීය ලේකම්/විදුහල්පති/දහම් පාසල් ප්‍රධානාචාර්ය

..............................................................................................................................................

සංස්කෘතික නිළධාරිගේ නිර්දේශය
පළාත් අධ්‍යක්ෂ,

ඉහත තොරතුරු සත්‍ය බවත් මෙම අයදුම්කරු .................................... ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ .................. ග්‍රාම නිළධාරි වසමේ ස්ථිර පදිංචි අයෙකු බව සහතික කරමි.

-------------------- --------------------------- -------------------------------

දිනය. අත්සන නිළමුද්‍රාව